## 1.1 හැඳින්වීම

පෙරදිග නර්තන කලාවෙහි කේන්ද්‍රස්ථානය වූ භාරතයේ සම්භාව්‍ය කලා අතර උත්තර භාරතීය හින්දුස්ථානී සංගීතය පසුබිම් සංගීතය ලෙස යොදාගත් නර්තන ශෛලිය වන්නේ කථක් නර්තනය යි. හින්දු ආගමික පසුබිම මුල් වී ආරම්භය ලැබූ කථක් නර්තන කලාව ශාස්ත්‍රිය වශයෙන් ඉතා ගැඹුරු වපසරිය ක් පුරා ව්‍යාප්ත වී ඇත . එමෙන්ම එහි දක්නට ලැබෙන අති සුන්දර චලන මාධ්‍යය සංගීතය හා මුසු ව ඉදිරිපත් වීමෙන් ප්‍රාසංගිකත්වය උද්වේගකර හා චමත්කාරජනක අයුරින් බිහිවේ. වේගවත් භ්‍රමණ හා මටසිලිටි හස්ත පාද චලනයන් ද සංකීර්ණ ලය ප්‍රකාර ද එක්වීමෙන් බිහි වී ඇති කථක් නර්තනය අති සුන්දර නෘත්‍ය කලාවකි. හින්දු ආගමික පසුබිමෙන් බිහිවුන ද පසුකාලයේ මෝගල් අධිරාජ්‍යයේ බලපෑම හේතු කොටගෙන මෙම නර්තන ශෛලිය රාජ සභා නර්තන ශෛලිය ක් සේ විකාශය විය. නමුත් මෝගල් අධිරාජ්‍ය යේ ආක්‍රමණත් සමග මුස්ලිම් රජ වාසල දක්වා කථක් නර්තනය පැමිණීමෙන් ආගමික අරමුණ යටපත් වී හුදු විනෝදාස්වාදය පමණක් ඉස්මතු විය. එහි දී ප්‍රාසංගික වේදිකාව දක්වා කථක් නර්තනය ව්‍යාප්ත වීම ට මූලාරම්භය සිදුවූයේ මුස්ලිම් රජ වාසලෙනි.

රජ වාසලින් ප්‍රසංග වේදිකාව දක්වා පැමිණි කථක් නර්තනය රට රටවල් අතර අන්තර් සම්බන්ධතාව වර්ධනය වීම ත් සමග ම විද්‍යුත් මාධ්‍ය තරණය කිරීමෙහි ලා සමත් විය. එනම් ප්‍රසංග වේදිකාවෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යක් වූ සිනමාව ට ඉන්පසු රූපවාහිනිය දක්වා ද කථක් නර්තනය විකාශනය විය. මෙහි දී ඉතා සීමිත ප්‍රේක්ෂක පිරිසක් පමණක් රස විඳීම ට හැකිවූ කථක් නර්තනය විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය ට ප්‍රවිෂ්ඨ වීම නිසා වැඩි ප්‍රේක්ෂක සංඛ්‍යාවක ට රස විඳීමේ හැකියාව උදාවිය. කථක් නර්තනය මගින් භාව ප්‍රකාශනය මැනවින් පිළිබිඹු කිරීම ට ද හැඟීම් ජනනය කිරීම ට හා ප්‍රේක්ෂකයා භාව විශෝධනය ට ලක්කර මානසික විශ්‍රාන්තිය කරා ගෙන යාම ට ද හැකිය. එවන් වූ හැකියාවක් ඇති කථක් නර්තනය බොලිවුඩ් සිනමාව ට සම්ප්‍රාප්ත වීමත් සමග ඉන්දීය ප්‍රේක්ෂකයා ගේ හා ජාත්‍යන්තර ප්‍රේක්ෂකයා ගේ සිත් සතන් තුළ ට නව මානයකින් ළඟාවන්නා ට විය.

බොලිවුඩ් සිනමාව යනු ප්‍රබල විකාශන මාධ්‍යයකි. වසර ගණනාවක් බොලිවුඩ් සිනමාව ප්‍රචාරක වාර්තාමය අධ්‍යාපනික හා සමාජ විද්‍යාත්මක කරුණු නිරූපණය කිරීම ට යොදාගෙන ඇත. එසේ ම බොලිවුඩ් සිනමාව විද්‍යාව වින්දනය හා විනය ඇති කිරීම ට ද භාවිතා කර ඇති අතර එය වඩාත් කැපී පෙනෙනුයේ මුළු ලොව පුරා ද ඉතා ජනප්‍රිය විනෝදාත්මක මාධ්‍යක් වශයෙනි. මෙවන් වූ වින්දනීය මාධ්‍යක් තුළ ම එවන් වූ තවත් වින්දනීය මාධ්‍යක් වන කථක් නර්තනය මුසු වීමෙන් ප්‍රේක්ෂකයා වෙත රසඥතාවයෙන් පෝෂිත වූ කලා මාධ්‍යක් සම්ප්‍රේෂණය වේ. වේදිකාව මත ස්වාධීන කලාවක් වූ කථක් නර්තනය සිනමාව ට ප්‍රවිෂ්ඨ වීමෙන් එය සිනමාව තුළ අනු කලාවක් විය. නමුත් කථක් නර්තනය බොලිවුඩ් සිනමාව ට ප්‍රවිෂ්ඨ වීම එය ලබාගත් දියුණුවක් ලෙසට සැළකිය හැකිය.

මෙහි දී බේලිවුඩ් සිනමාවෙහි භාවිත කථක් නර්තන යේ ප්‍රසාංගිකත්වය සැළකීමෙ දී එහි ශාස්ත්‍රීය පදනම නිර්මාණශීලීත්ව යේ ශක්‍යතාවය ඇඳුම් පැළඳුම් ආලෝකකරණය රංග වින්‍යාසය යනාදිය වේදිකාව ට සාපේක්ෂ ව බොහෝ සෙයින් වෙනස්වීම කෙබඳු ආකාරයකින් කථක් නර්තන යේ ප්‍රසාංගිකත්වය ට බලපා ඇත්ද? යන්න දැන ගැනීම සඳහා කථක් නර්තනය හා සිනමා තාක්‍ෂණය පිළිබඳ දැනුමින් පෝෂණය වූ විද්වතුන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත හා තොරතුරු ලබාගන්නා ලදී . එසේ ම කථක් නර්තනය මුසුකොට නිපදවා ඇති තෝරා ගන්නා ලද බොලිවුඩ් චිත්‍රපට කිහිපයක් ගෙන නිරීක්‍ෂණය කිරීම මගින් ද පර්යේෂණයේ අරමුණ හා අභිමතාර්ථ වෙත ළගා විය.

මෙහිදී නිරීක්‍ෂණය සඳහා චිත්‍රපට තුනක් උපයෝගී කොටගත් අතර ඒවා පාකීසා, දේව්දාස් (2002), මොග්ලේ ආසම් ලෙසින් නම් කළ හැකිය. මෙසේ මෙම චිත්‍රපට තෝරා ගැනීම ට හේතු වූයේ උක්ත චිත්‍රපට අනෙකුත් බොලිවුඩ් සිනමාපට වලට සාපේක්ෂ ව කථක් නර්තනය වැඩි වශයෙන් භාවිත කොට තිබීමයි. එසේම තවත් කරුණක් ලෙස මෙම සෑම චිත්‍රපටය ක ම ශාස්ත්‍රීය කථක් නර්තනය දක්නට ලැබීම තවත් හේතුවකි. දේව්දාස් 2002 හා පාකීසා යන චිත්‍රපට තුළ කථක් නර්තනය ගණිකාවන් වෙනුවෙන් උපයෝගී කොට ගෙන ඇති අතර මොග්ලේ ආසම් චිත්‍රපට යේ රාජ සභා  නර්තනයක් වෙනුවෙන් කථක් උපයෝගී කොට ගෙන ඇත. මෙම වෙනස්වීම මත කථක් නර්තනයේ වෙනස කෙබඳු දැයි අධ්‍යයනය කිරීම ද අන්තර්ගත විශ්ලේශනය මගින් සිදුවේ.

උපන්‍යාසයන් ද, දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය යටතේ ද, අන්තර්ගත විශ්ලේෂණය තුළින් ද පර්යේෂණ යේ අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කරගන්නා ලදී. මෙතෙක් පර්යේෂණ සිදු නොවුනු පරාසය ක් තුළ පර්යේෂණය  සිදුකරනු ලැබුවේ, ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායන් සිනමා ප්‍රවාහයක් තුළට අන්තර්ගත කොට තිබීමෙන් සිනමා කෘතියට සාධාරණත්වයක් ඉටුවේ ද, ඒ මගින් කථක් නර්තනයේ ප්‍රසාංගිකත්වය ඉස්මතුවේ ද, යන්න විශ්ලේෂණය කිරීම සඳහා වේ.

මෙම පර්යේෂණ මාතෘකාව හුදෙක් නිබන්ධනය මත ම සීමා නොකොට එම දත්ත පදනම් කරගනිමින් බොලිවුඩ් සිනමාව තුළ ට කථක් නර්තනය රැගෙන විත් ඇති ආකාරය අධ්‍යනය කිරීම හා ඒ ඇසුරින් චිත්‍රපට ක්ෂේත්‍රය තුළ කථක් නර්තනය වර්ධනය හා ව්‍යාප්ත විය යුතු ආකාරය පෙන්වා දීම ට දායක වීම මෙහි අරමුණ වේ. යතා කාලයේ දී මෙම පර්යේෂණය ඉංග්‍රීසි භාෂාව ට පරිවර්තනය කොට අන්තර්ජාලය තුළ ට ඇතුල් කිරීම ට බලාපොරොත්තුවක් ඇති බැවින් මෙය කථක් නර්තනය අධ්‍යනය කරන පිරිසෙ හි දැණුම වර්ධනයට ත් චිත්‍රපට ක්ෂේත්‍රය තුළ කථක් නර්තනය ව්‍යාප්ත කරන්නන් ගේ භාවිතයට ත් ඉවහල් වනු ඇති බව නොඅනුමානය.